

සභාපති ඩීටර් එෆ්. උක්ඩෝෆ් විසිනි
පළමුවෙනි සභාපතිත්වයේ දෙවන උපදේශකවරයා

# ප්‍රේමයෙන් පසුව, එන්නේ කුමක්ද?

අප ආදරණීය අනාගතවක්තෘ, තෝමස් එස්. මොන්සන් සභාපතිවරයා මෙසේ උගන්වා ඇත, "ශුභාරංචියේ නියම සාරය ප්‍රේමයයි."[1]

ප්‍රේමය කෙතරම් වැදගත්ද යත් යේසුස්වහන්සේ එය උතුම්වූ පළවෙනිවූ අණදාව" ලෙස හඳුන්වා, මුළු ව්‍යවස්ථාවත්, අනාගතවාක්‍යයත් ඒ මත පිහිටා තිබෙන බවත් කීසේක.[2]

අප සභාව තුල කරන සියල්ලේ ප්‍රධාන අභිප්‍රාය ප්‍රේමයයි. සෑම වැඩසටහනක්ම, සෑම රැස්වීමක්ම, සෑම ක්‍රියාවක්ම තුල යෙසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් ලෙස අප කොටස්කරුවන් වන අතර, මෙම ගුණාංගයේ ප්‍රතිපලයක්ද විය යුතුය—මන්ද ප්‍රේමය, "ක්‍රිස්තුස්වහන්සේගේ පවිත්‍ර ප්‍රේමය," නොමැතිව, අපි ශූන්‍යවෙමු.[3]

අපි වරක් මෙය අපගේ මනසින් සහ හදවතින් අවබෝධකරගෙන, වරක් දෙවියන්වහන්සේට සහ අපගේ සහෝදර ජනතාවට අප දක්වන ප්‍රේමය ප්‍රකාශකළ විට—ඉන්පසුව එන්නේ කුමක්ද?

අන් අය වෙනුවෙන් දයාව සහ ප්‍රේමය හැඟීම පමණක් ප්‍රමාණවත්ද? අප දෙවියන්වහන්සේට සහ අපගේ අසල්වැසියාට ප්‍රේමය ප්‍රකාශකිරීම දෙවියන්වහන්සේට අපගේ ඇති බැඳීම තෘප්තිමත් කරයිද?

## පුත්‍රයන් දෙදෙනාගේ උපමාකථාව

යෙරුසලම් දේවමාළිගාවේ, යුදෙව්වරුන්ගේ ප්‍රධාන පූජකවරුන් සහ වැඩිහිටියන් යේසුස්වහන්සේව වචනවලින් අල්ලාගැනීම සඳහා උන්වහන්සේ වෙත පැමිණියහ. ගැලවුම්කරුවාණෝ කෙසේවුවද, කථාන්තරයක් කීම මගින් තත්වය වෙනස්කළසේක.

"එක්තරා මනුෂ්‍යයෙකුට පුතුන් දෙදෙනෙක් සිටියහ," කියමින් උන්වහන්සේ ආරම්භ කළහ. පියා පළමුවැන්නා ළඟට ගොස්, මිදිවත්තේ සේවයකිරීමට යන ලෙස ඔහුට කීවේය, නමුත් පුත්‍රයා එය ප්‍රතික්ෂේප කළේය. පසුව එම පුත්‍රයා "පසුතැවී, ගියේය."

ඉන්පසුව පියා ඔහුගේ දෙවෙනි පුත්‍රයා ළඟට ගොස්, මිදිවත්තේ සේවයට යන ලෙස කීවේය, දෙවෙනි පුත්‍රයා යන බවට සහතික වුව නමුත්, ඔහු ගියේ නැත.

ගැලවුම්කරුවාණන් ඉන්පසුව, පූජකවරුන් සහ වැඩිහිටියන් වෙත හැරී, මෙසේ ඇසීය, "මෙම පුතුන් දෙදෙනාගෙන් පියාගේ කැමැත්ත ඉටුකලේ කව්ද?"

ඒ පළවෙනි පුත්‍රයා බව පිළිගැනීමට ඔවුන්ට සිදුවිය—ඔහු මුලින් යන්නේ නැතැයි කියූ නමුත් පසුව පසුතැවී මිදිවත්තේ සේවයට ගියේය.[4]

ගැලවුම්කරුවාණන් මෙම උපමාකථාව පාවිච්චි කළේ මූලධර්මයේ වැදගත්කම අවධාරණයකිරීමටය— පණත්වලට කීකරුවන අය, සත්‍යලෙසම දෙවියන්වහන්සේට ප්‍රේමකරන අයයි.

සමහරවිට, ඵරිසිවරුන් සහ ලියන්නන්ට සවන්දී ඔවුන්ගේ වචන අනුගමනයකිරීමටත්, නමුත්, ඔවුන්ගේ ආදර්ශය අනුගමනය නොකිරීමට යේසුස්වහන්සේ ජනතාවට කීවේ එනිසා විය හැකිය.[5] එම ආගමික ගුරුවරු ප්‍රකාශකරන ලෙස කටයුතු නොකළහ ඔවුහු ආගම ගැන කථාකිරීමට ප්‍රියාකළහ. නමුත් ඔවුහු එහි සාරය අතහැරීම කණගාටුවකි.

## ක්‍රියා සහ අපගේ ගැලවීම

ගැලවුම්කරුවාණන්වහන්සේ සිය ගෝලයන්ට දුන් අවසාන පාඩම්වලින් එකක, අවසාන විනිශ්චය ගැන උන්වහන්සේ ඔවුන්ට කී සේක. දුෂ්ටයන් සහ ධර්මිෂ්ටයන් වෙන්කරනු

ඇත, යහපත් අය සදාකාලික ජීවනය උරුමකරගනිති: දුෂ්ටයන් සදාකාලික දඬුවමට බාරදෙනු ලබන්නේය.

මෙම කණ්ඩායම් දෙක අතර වෙනස කුමක්ද?

තම ක්‍රියා තුලින් ප්‍රේමය ප්‍රදර්ශනය කරන අය, ගැලවීම ලබන්නෝය. එසේ ක්‍රියා නොකරන්නන් දඬුවමට බාරදෙනු ලබන්නේය.[6] යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියට සහ එහි වටිනාකම්වලට සහ මූලධර්මවලට සැබෑ ලෙසම හැරීඒම, අපගේ දිනපතා ජීවිතවල ක්‍රියා මගින් පෙනෙනු ඇත.

අවසානයේදී, දෙවියන්වහන්සේට සහ සහෝදර ජනතාවට ප්‍රේමය හුදෙක් ප්‍රකාශකිරීම මගින් පමණක් අපි උත්කර්ෂයට සුදුසුකම් නොලබන්නෙමු. ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්ගේ කැමැත්ත කරන්නා මිස, මට ස්වාමීනී, ස්වාමීනී, කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නෝය."[7]

## ප්‍රේමයෙන් පසුව එන්නේ කුමක්ද?

එම ප්‍රශ්නයට පිළිතුර, "ප්‍රේමයෙන් පසුව එන්නේ කුමක්ද?" සරල සහ අවංක විය හැකිය. අපි අවංකවම ගැලවුම්කරුවාණන්ට ප්‍රේමකරන්නේ නම්, අපි අපගේ හදවත් උන්වහන්සේ වෙත නැඹුරු කරමින්, ඉන්පසුව අපි ගෝලකමේ මාවතේ ගමන් කරන්නෙමු. අපි දෙවියන්වහන්සේට ප්‍රේමකරන විට, අපි උන්වහන්සේගේ පණත් තැබීමට පරිශ්‍රම දරන්නෙමු.[8]

අපි අපේ සහෝදර ජනතාවට සැබෑ ලෙසම ප්‍රේමකරන්නේ නම්, "දුප්පතුන්ට සහ අවශ්‍යතා ඇති අයටද, රෝගීන් සහ දුකට පත්වූවන්ටද, උපකාරකිරීමට අපි හස්ත දිගුකරන්නෙමු."[9] මක්නිසාද දයාන්විත සහ සේවයේ ක්‍රියා කරන අය,[10] යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් වන්නෝය.

ප්‍රේමයෙන් පසුව එන්නේ මෙයයි.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියේ සාරය මෙයයි.

**සටහන්**

1. තෝමස් එස්. මොන්සන්, "Love—the Essence of the Gospel," *Liahona,* මැයි 2014, 91.
2. බලන්න මතෙව් 22:36–40.
3. බලන්න මොරෝනි 7:46–47.
4. බලන්න මතෙව් 21:28–32.
5. බලන්න මතෙව් 23:3.
6. බලන්න මතෙව් 25:31–46.
7. මතෙව් 7:21.
8. බලන්න යොහාන් 14:15.
9. දහම සහ ගිවිසුම 52:40.
10. බලන්න මොසායා 18:8–9.

## මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ ගෝලයෝ නම් ඔවුන්ගේ ක්‍රියා තුලින් උන්වහන්සේට සහ අන් අයට ඔවුන්ගේ ප්‍රේමය පෙන්වන අය බව සභාපති උක්ඩෝෆ් අර්ථ දක්වයි. "අපි අවංකවම ගැලවුම්කරුවාණන්ට ප්‍රේමකරන්නේ නම්, අපි අපගේ හදවත් උන්වහන්සේ වෙත නැඹුරු කරමින්, ඉන්පසුව අපි ගෝලකමේ මාවතේ ගමන් කරන බව" ඔහු අපට උගන්වයි. ඔවුන්ට ගෝලකමේ මාවතේ යාමට ප්‍රේමය ඔවුන්ව පොළඹවන්නේ කුමන අන්දමින්දැයි, ඔබ උගන්වන අයගෙන් ඇසීම ගැන සළකා බලන්න. අපි දෙවියන්වහන්සේට ප්‍රේමකරන විට, අපි උන්වහන්සේගේ පණත් තැබීමට පරිශ්‍රම දරන්නෙමු. 8 ඔබගේ අත්දැකීම්ද ඔවුන් සමග බෙදාගැනීමට ඔබට හැකිය. ප්‍රේමයෙන් යුතුව ක්‍රියාකිරීමට ප්‍රේමය සහ ශක්තිය වැඩියෙන් ලබාගැනීමට යාච්ඥාකිරීමට ඔවුන්ට ආරාධනාකිරීම ගැන සළකාබැලීමට ඔබට පුළුවන.

## තරුණ අය

### පණත් තැබීම සහ අන් අයට ප්‍රේමකිරීම

අපි ප්‍රේමය ගැන සිතන විට, නිතරම සිතට එන පළමු දෙය නම්, ශෘංගාර චිත්‍රපට, චොකලට් සහ මල් යනාදියයි. නමුත් ප්‍රේමය—සැබෑ ප්‍රේමය—වනාහි බොහෝ ගැඹුරු සහ ඊට වඩා බොහෝ ආත්මාර්ථ නොවූ දෙයකි, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට ප්‍රේමකළ නිසා, අප වෙනුවෙන් ජීවත්වී, අප වෙනුවෙන් මියගියසේක. ඇත්තවශයෙන්ම, වඩා උතුම් ආඥා දෙක නම්, දෙවියන්වහන්සේට ප්‍රේමකිරීම සහ අනෙක් සෑම දෙනාටමද ප්‍රේමකිරීමය (බලන්න මතෙව් 22:36–40). නමුත් අපි අන් අයට ප්‍රේමකරන බව ඔවුන්ට පෙන්වන්සේ කෙසේද?

සභාපති උක්ඩෝෆ් පුත්‍රයන් දෙදෙනාසේ උපමාකථාව බෙදාගනියි. සිය පියාට සේවයකරන තැනැත්තා සහ එසේ නොකරන තැනැත්තාය. ගැලවුම්කරුවාණන් පෙන්වා දෙන්නේ සිය පියාට කීකරුවූ තැනැත්තා පමණක් ඔහුට සැබෑ ලෙසම ප්‍රේමකළ බවයි. ඒ හා සමානව, අපි දෙවියන්වහන්සේගේ පණත්වලට කීකරුවන විට, අපගේ ප්‍රේමය අපි උන්වහන්සේට පෙන්වමින්, උන්වහන්සේ වෙත නැවත යාමට අවශ්‍ය බවද අපි පෙන්වන්නෙමු

නමුත් අපි අනෙක් සෑම දෙනාටමද ප්‍රේමකරන බව පෙන්වන්නේ කෙසේද? සභාපති උක්ඩෝෆ් එයද පැහැදිළි කරයි: " අපි අපේ සහෝදර ජනතාවට සැබෑ ලෙසම ප්‍රේමකරන්නේ නම්, අපි 'දුප්පතුන් සහ අවශ්‍යතා ඇති අය, රෝගීන් සහ දුකට පත්වූ අයට' උපකාරකිරීමට ඉදිරිපත් වන්නමු. මන්ද මෙම දයාව සහ සේවය නම් ආත්මාර්ථ නොවූ ක්‍රියා කරන අය, එම අයම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් වන්නෝය."

එනිසා ඊළඟ වතාවේ ඔබගේ දෙමාපියෙක්, දරුවෙක්, හෝ මිතුරෙක් ඔබ දුටුවිට, ඔබගේ ආදරය ඔවුන්ට පෙන්වීම සඳහා ඔවුන්ට සේවයකිරීම ගැන සිතන්න. එමගින් ඔවුන් සහ ඔබවද ප්‍රීතියට පත්වනවා පමණක් නොව, ස්වර්ගයේ වැඩසිටින ඔබගේ පියාණන්ද ප්‍රීතියට පත්වනසේක.

## ළමයි

### ප්‍රේමය පෙන්වීම

යේසුස්වහන්සේ පියෙක් සහ ඔහුගේ පුතුන් දෙදෙනාගේ කථාව බෙදාගත්සේක. පියා මිදිවත්තක සේවයකළ අතර, උපකාරකරන ලෙස ඔහුගේ පුතුන් දෙදෙනාට කීවේය. පළවෙනි පුතා පළමුව නැත යයි කී නමුත් පසුව උපකාරකිරීමට මිදිවත්තට ගියේය. දෙවන පුත්‍රයා උපකාරකරන බව කී නමුත් ඔහු පසුව එය කළේ නැත. පළමු පුත්‍රයා ඔහුගේ පියාට කීකරුවීම තුලින් වැඩි ප්‍රේමයක් ඔහුගේ පියාට පෙන්වූ බව යේසුස්වහන්සේ ඉගැන්වූසේක.

මෙම කථාව ක්‍රියාවෙන් පෙන්වන්න! ඉන්පසුව ස්වර්ගික පියාණන්වහන්සේට ඔබගේ ප්‍රේමය පෙන්වීමට යම් දේවල් තුනක් ලියන්න, නැතහොත් අඳින්න.

© 2016 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. අඑජ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/15. පරිවර්තන අනුමැතිය: 6/15. *First Presidency message September 2016* පරිවර්තනයයි. Sinhala. 12869 408

# දෙමාපියත්වය පූජනීය රාජකාරියකි

*මෙම ලිපිය යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකර බෙදාගන්නේ කුමක්දැයි දැනගැනීමට ආනුභාවය සොයන්න. "පවුල: ලෝකයාට ප්‍රකාශනයකි" යන පත්‍රිකාව තේරුම්ගැනීමෙන් දෙවියන්වහන්සේ තුල ඔබගේ ඇදහිල්ල වැඩිකර, බැහැදැක ඉගැන්වීම් තුලින් ඔබ සොයාබලන අය ආශිර්වාදිතවන්නේ කෙසේද? වැඩිදුර තොරතුරු සඳහා යන්න, reliefsociety.lds.org*

ඇදහිල්ල, පවුල, සහනය

අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ පවුල් පිහිටුවා, ප්‍රෙමනීය වාතාවරණයක් තුල නිවැරදි මූලධර්ම ඉගැන්වීමට අපට උපකාරකළසේක. සභාපති තෝමස් එස්. මොන්සන් මෙසේ කීවේය: "ඔබගේ දරුවාට ස්තුතියක් සහ හාදුවක් දෙන්න: මම ඔබට ගොඩක් ආදරෙයි කියන්න: නිතරම ඔබගේ ස්තුතිය ප්‍රකාශකරන්න, විසඳාගත හැකි ප්‍රශ්නයක්, ඔබ ප්‍රේමකරන පුද්ගලයාට වඩා වැදගත්වීමට කිසිවිට ඉඩ නොතබන්න."[1]

සුසාන් ඩබ්ලිව්. ටැනර්, හිටපු තරුණ කාන්තා ප්‍රධාන සභාපතිනිය මෙසේ ඉගැන්වූවාය: "අප අනුගමනයකළ යුතු ක්‍රමය ගැන අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ ආදර්ශමත්වනසේක. උන්වහන්සේ අපට ප්‍රේමකරනසේක. අපට උගන්වනසේක, උන්වහන්සේ අප ගැන ඉවසනසේක, අපගේ කර්තෘත්වය අපට පවරාදෙනසේක. … සමහර අවස්ථාවලදී හික්මවනසේක, එහි අදහස, 'ඉගැන්වීම,' යනු විවේචනයේදී ව්‍යාකූල වනබවය. ළමයි—සියලු වයසේම ජනතාවද—වැරදි සෙවීමට වඩා ප්‍රේමයෙන් සග දිරිගැන්වීමෙන් හැසිරීම දියුණුකරන්නෝය."[2]

"අපි ඇදහිලිමත්ව පවුලේ යාච්ඤාව පවත්වමින්, ශුද්ධ ලියවිලි අධ්‍යයකර, පවුල් නිවාස සැන්දෑව පවත්වමින්, පූජක ආශිර්වාද ලබාගෙන, සබත් දිනය පිළිපදින්නේ නම්" ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි ක්වින්ටින් එල් කුක් මෙසේ කීවේය. "අපගේ ළමයින් … අසීරු ලෝකයක ඔවුන් මත කුමක් පතිතවුවද, ස්වර්ගයේ සදාකාලික නිවාසය සූදානම් කරති. "[3]

### අමතර ශුද්ධ ලියවිලි

1 නෙපී 8:37; 3 නෙපී 22:13; දහම සහ ගිවිසුම 93:40; 121:41

### ජීවමාන කථාන්තර

"මම පත්තරය කියවමින් සිටියදී, මගේ එක් මුනුබුරෙක් මට තුරුල්විය," යයි ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි රොබට් ඩී. හේල්ස් කීවේය. "මා කියවන විට, පසුබිමේ සිට කථාකරන ඔහුගේ මිහිරි කටහඬින් මම බොහෝ ප්‍රීතියට පත්වීමි. සුළු මොහොතකට පසුව, ඔහු මා සහ පත්තරය මැදට තල්ලුවී ආවිට, මාගේ මවිතවීම ගැන සිතාබලන්න. මගේ මුහුණ ඔහුගේ අත්වලින් අල්ලාගෙන, ඔහුගේ නාසය මාගේ නාසයට තදකරමින්, ඔහු මෙසේ ඇසීය, 'සීයා! ඔබ එහි සිටින්නේද?'

"… එහි සිටීම යන්නෙහි අදහස, අපගේ තරුණ අයගේ හදවත තේරුම්ගෙන, ඔවුන් සමග සම්බන්ධවීමය. එසේම ඔවුන් සමග සම්බන්ධවීම යනු, ඔවුන් සමග කථාකිරීම නොව, නමුත් ඔවුන් සමග වැඩකිරීමය. …

"අපි ඉගැන්වීමේ අවස්ථාවන් සැලසුම්කර එහි වාසිය ගතයුතුය.

"… මා වැඩියෙන් ජීවත්වන තරමටම, මාගේ තරුණ කාලයේ ඉගැන්වීමේ අවස්ථාවන්,, විශේෂයෙන්ම මාගේ දෙමාපියන් ලබාදුන් අවස්ථා, මගේ ජීවිතය හැඩගන්වා, මා සිටින තත්වයට මාව පත් කළේය."[4]

**සටහන්**

1. තෝමස් එස්. මොන්සන්, "Love at Home—Counsel from Our Prophet," *Liahona, අගෝ.* 2011, 4.
2. සුසාන් ඩබ්. ටැනර්, "Did I Tell You … ?" *Liahona,* May 2003, 74.
3. කුවෙන්ටින් එල්. කුක්, "Did I Tell You … ?" *Liahona,* මැයි 2015, 64
4. රොබට් ඩී. හේල්ස්, "Our Duty to God: The Mission of Parents and Leaders to the Rising Generation," *Liahona,* මැයි 2010, 96, 95.

### *මේ ගැන සළකාබලන්න*

ප්‍රේමයේ භාෂාවෙන් සහ ආදර්ශය මගින් ගෘහාරංචිය හොඳින් ඉගැන්විය හැක්කේ කෙසේද?

© 2016 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. අඑජ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/16. පරිවර්තන අනුමැතිය 6/16. *Visiting Teaching Message, September 2016* පරිවර්තනයයි. Sinhala. 12869 408